# පුංචි ඡන්දය කඩිනම් කරන්නැයි ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්

නිශාන්ති රාමනායක - කොළඹ අධිකරණ

කල් දමා ඇති පළාත් පාලන ආයතනවලට නියෝජිතයන් තෝරාගැනීම සඳහා ඡන්දය කඩිනමින්

පිටුව 2



## පුංචි ඡන්දය .....

පවත්වන ලෙසට පළාත් පාලන අමාත්‍යවරයා ප්‍රමුඛ බලධාරීන්ට නියෝග කරන්නැයි ඉල්ලා පැෆරල් සංවිධානය විසින් ගොනු කර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සම විභාගයට ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණය ඊයේ (03) අවසර දුන්නේය.

පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ කිංස්ලි හෙට්ටිආරච්චි මහතා විසින් ගොනුකර තිබූ එම මූලික අයිතිවාසිකම් පෙත්සම ප්‍රියසාද් ඩෙප්, උපාලි අබේරත්න හා නලින් පෙරේරා යන විනිසුරු මඩුල්ල හමුවේදී කැඳවිණි.

එහිදී එම පෙත්සම ලබන ජනවාරි 30 වැනිදා විභාගයට ගැනීමට දින නියම කළ විනිසුරු මඩුල්ල ඊයේ සිට සති හතරක් ඇතුළත විරෝධතා ගොනු කරන ලෙසට වගඋත්තරකරුවන්ට නියෝග කළේය.

පළාත් පාලන අමාත්‍ය නීතිඥ ෆයිසර් මුස්තාපා, එම අමාත්‍යාංශයේ ලේකම්, නීතිපතිවරයා, මැතිවරණ කොමිසම් සභාව සහ සීමා නිර්ණය කමිටුව ඇතුළු 11 දෙනකු එම පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස නම් කොට තිබුණි.